# හිස වෙස් බැඳීමේ මහා මංගල්‍යය



වසර 2003 මාර්තු මස මෙල්බන් නුවර බිහි වු රංගන උදුම්බරා නර්තන කණ්ඩායමේ මේ ගෙවී යන්නේ එකොළොස් වන වසරය. මේ වසර ගණනාවටම එම කණ්ඩායමෙන් විශාල සිසු පරපුරක් මෙල්බන් නුවරට බිහිවී ඇත. ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික නර්තනය ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ප්‍රචලිත කිරීම එම නර්තන කණ්ඩායමේ පරමාර්ථය විය. නර්තන විෂය සාමාන්‍ය ආකාරයෙන් ඉගෙන ගැනීමත්, එම විෂයේ ශිල්පීයත්වයට පත්වීමත් යන කරුණ අහසට පොළව වගේ වෙනස් අන්ත දෙකකි.

මෙම ශිල්පය ප්‍රගුණ කල ශිෂ්‍යයෙක් හෝ ශිෂ්‍යාවක් නර්තන විෂයේ පරිපූර්ණත්වයට පැමිණි බවට තිබෙන එකම සාමාකය නම් ඔහු හෝ ඇය,සාම්ප්‍රදායික උඩරට නැටුම් ඇඳුම් කට්ටලයේ (වෙස් ඇඳුම් කට්ටලය) ප්‍රධාන ආභරණය වන වෙස් තට්ටුව ශුභ මොහොතක් බලා ගමේ පන්සල් භූමිය තුල තම ගුරුවරයා විසින් හිසට පැළඳීමය. තම ගුරුවරු,දෙමාපියන් හා නැදෑ හිත මිතුරන් ඉදිරියේ තමන් මෙම කලාවේ ප්‍රවීනත්වයට පැමිණ ඇති බවත්, එදින සිට තමා වෘත්තීය නර්තන ශිල්පියෙකු ලෙස වරම් ලබන බවත් මේ සියලු පිරිස ඉදිරියේ සාක්ෂි දරන උත්සවය "හිස වෙස් තැබීමේ මහා මංගල්‍යය" ලෙස හඳුන්වනු ලබයි.

හිස වෙස් තැබීමට ශිෂ්‍යයා නියම සුදුස්සකු වන්නේ, ඔහු/ඇය පූර්ණ කාලීනව නර්තන ආයතනයේ සතිපතා පැවැත්වෙන පන්ති වලට සහභාගි වෙමින් මෙම ශිල්පය ශාස්ත්‍රානුකූලව වසර ගණනාවක් හැදෑරීම තුලිනි. ඊට අමතරව කණ්ඩායමට ආරාධනා ලැබෙන ප්‍රසංග වලට තම දායකත්වය ලබාදෙමින් එක් රැස් කරගන්නා අත්දැකීම්, තවද කණ්ඩායමේ සිටින ලාබාල තම සොයුරු,සොයුරියන්ට තමන්ගේ දැනුම බෙදා දෙමින් එකතු කරගන්නා අත්දැකීම් මේ ආදී වශයෙන් මෙම ශිෂ්‍යයා නර්තන ශිල්පයේ ප්‍රවීනත්වයට පත්වීමට මහත් රුකුලක් වන්නේය.

වසර ගණනාවක් පුරාවට කරන මෙම හැදෑරීම විශාල කැපකිරීම් කරමින් ලබා ගන්නා ඉතා දුෂ්කරවූත් එහෙත් ඉතාම සුන්දරත්වූත් අත්දැකීමකි. නර්තන ශිල්පය හදාරන සිසුන් දහස් ගණන් අතුරෙන් මෙම ශිල්පීයත්වයට පත්වන්නේ ඉතාම අතලොසක් වීම ස්වභාවයයි. එයට ප්‍රධානතම හේතුව වන්නේ මෙම කැප කිරීම කරනු ලබන්නේ අවංකවම මෙම විෂයට ආදරය කරන සිසුවියන් පමණක් වීමය.

රංගන උදුම්බරා නර්තන කණ්ඩායමේත් මේ අවංක කැපකිරීම වසර දහයක් පුරාවට කරන ලද දැරියන් දස දෙනෙකුත් ඉහත සඳහන් කරන ලද හිස වෙස් තැබීමේ මහා මංගල්‍යයට මේ දිනවල සුදානමින් පසු වන්නෝය. තමන් ඉතා දුෂ්කර මෙන්ම සුන්දර අත්දැකීම් ලබමින්, ඉතා දිගු කාලයක් නර්තන කණ්ඩායමේ රැඳී සිටිමන් ඉගෙන ගන්නා ලද දැනුමෙන් වෘත්තීය නර්තන ශිල්පිනියන් ලෙස වරම් ලබමින් හිස වෙස් තබනුයේ මෙම මැයි මස 25 වන ඉරු දින උදෑසන 8.30 ට යෙදෙන ශුභ මොහොතින් කීස්බරෝ ධම්මසරණ විහාරස්ථානයේදීය. මෙසේ දොරට වඩින දැරියන් වයස අවුරුදු 13 සිට 24 දක්වා වු නව යොවුන් වියේ පසුවන්නෝ වෙති.

මෙසේ මෙම නර්තන විෂය හදාරමින් එහි අර්ථවත් වු අග්‍ර ඵලය නෙලා ගන්නා මෙම සිසුවියන් දස දෙනා නම්:

1) Melissa Adikari
2) Nipuni Bandaranayake
3) Nipuni Dissaíyake
4) Amanda Jayathilake
5) Yasiru Karunaratne
6) Aruni Mapa Mudiyanselaga
7) Kushanee Perera
8) Vinushi Perera
9) Sachini Perera
10) Lanka Wickramaarachchi

මොවුන් මෙම නර්තන කණ්ඩායමේ දීර්ඝ කාලයක් රැදෙමින් විවිධ වූ ප්‍රසංගවලට සහභාගි වෙමින්, ඕස්ට්‍රේලියානු නර්තන උළෙල පවා නියෝජනය කරමින් විශාල අත්දැකීම් සම්භාරයක් ලද්දෝ වෙති. එමෙන්ම මෙම දැරියන්ගේ සියලුම දෙමව්පියන් මෙම දීර්ඝ කාලය පුරාවටම කරන ලද උදව් උපකාර මෙන්ම කැපකිරීම් කියා නිමකල නොහැක. ඔවුන්ගේ නැප කිරීම නොවන්නට මෙවන් දවසක් උදා වීමත් සිහිනයක් වන්නට තිබුණාය. මේ සියලු කැපකිරීම් හා දුෂ්කර ක්‍රියාවේ අර්ථවත් ඵලය නෙලා ගන්නා දිනය තව නොබෝ දිනකින් මෙල්බන් නුවර වාසය කරන ඔබ සැමට ද දැක ගැනීමේ භාග්‍ය උදාවේ.

වසර දහස් ගණනක ඉතිහාසයේ සිට පැවත එන මෙම හිස් වෙස් තැබීමේ මහා මංගල්‍යය සියලු චාරිත්‍ර විධි සමඟින් සිය දෑසින් දැක බගා ගැනීම සඳහා ඉහත සඳහන් කල මැයි මස 25 වන ඉරුදින උදෑසන කීස්බරෝ ධම්මසරණ විහාරස්ථානයට පැමිණෙන ලෙස නර්තන කණ්ඩායම වෙනුවෙන් රංගනත්, උදුම්බරාත්, මෙම සිසුවියන්ගේ සියලුම දෙමාපියනුත් ඉතා ගෞරවයෙන් ඔබ සැමට විවෘත් ආරාධනයක් කර සිටිති. එමෙන්ම මෙදින වෙස් බැඳීමෙන් පසු මෙම සිසුවියන් නමෝ විත්තියෙන් කලඑළි බැසීමේ ප්‍රසංගය ජූලි මස 05 වන සෙනසුරාදා සවස 6.00 ට ඊමරඅදදා හි ඊැබ ඝැබඑැර රංග ශාලාවේදී උත්වාකාරයෙන් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර එදිනට ද කලා කාමී ඔබ සැමගේ සහභාගීත්ව අපේක්ෂා කර සිටිමු.

වැඩි විස්තර සඳහා අමතන්න:
උදුම්බරා - 0417149136 / 03 - 95617137





| CUT OFF DATE CANBERRA | ETD SYDNEY | ETA COLOMBO |
|---|---|---|
| 01 MAR 14 | 06 MAR 14 | 04 APR 14 |
| 22 MAR 14 | 27 MAR 14 | 28 APR 14 |
| 19 APR 14 | 24 APR 14 | 23 MAY 14 |
| 17 MAY 14 | 22 MAY 14 | 23 JUN 14 |
| 14 JUN 14 | 19 JUN 14 | 21 JUL 14 |
| 12 JUL 14 | 17 JUL 14 | 15 AUG 14 |
| 16 AUG 14 | 21 AUG 14 | 19 SEP 14 |
| 13 SEP 14 | 18 SEP 14 | 20 OCT 14 |
| 11 OCT 14 | 16 OCT 14 | 14 NOV 14 |
| 25 OCT 14 | 30 OCT 14 | 28 NOV 14 |
| 08 NOV 14 | 13 NOV 14 | 12 DEC 14 |
| 21 NOV 14 | 27 NOV 14 | 29 DEC 14 |
| 13 DEC 14 | 18 DEC 14 | 19 JAN 15 |


## 19 වන පිටෙන්

ගී කලාවට දායක වීය. "තාලම" නමින් පදනමක් පිහිටුවාගෙන බත්තරමුල්ලේ ජන කලා කේන්ද්‍රයේ ඇරඹූ ජන ගී පාඨමාලාවට අදටත් දෙමව්පියන්ගේ ඉහළ ඉල්ලුමක් තිබීම අපගේ මතු දරු පරපුර පිළිබඳව දකින්නට ලැබෙන සුභ නිමිත්තකි.

"අහසෙ ඉන්නවලු","ගම අවුලකද්කදං" වැනි ජන ගී විවිධ ප්‍රසංග ඉදිරිපත් කරමින් ජාතියේ අවධානය ජන ගී කලාව වෙනුවෙන් යොමු කරවා ගැනීමට අප්‍රතිහත ධෛර්යයෙන් යුක්තව කටයුතු කළ ලයනල් රන්වලයන් මීට එකළොස් වසරකට පෙර හදිසි අනතුරකින් වියෝ වූයේ නොසිතූ පරිද්දෙනි.

ලයනල් රන්වලයන් ඇරඹූ වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යමින් වඩ වඩාත් තාරුණ්‍යයේ ආකර්ශනය ලබා ගැනීමට එතුමන්ගේ පුත් සහන් රන්වල ඇතුළු රන්වල බලකාය සමත් වී සිටියි. "තාලම" පාඨමාලාවට අමතරව දිවයින පුරා දේශන, ප්‍රසංග හා වැඩමුළු පවත්වමින් ජන ගීය වටා රොද බැඳගත් ශිල්පින්ව ද රසිකයන් ව ද තම කණ්ඩායම සමග එක්කර ගැනීමට දරන්නේ කිව නොහැකි තරමේ උත්සාහයකි.

ලයනල් රන්වලයන්ගේ වියෝවෙන් පසුව රන්වල බලකායේ නිර්මාණ ලෙසින් එළි දැක් වූ "යුද්දෙටත් ඇවිත්","ත්‍රී","පොඩි අයට ජන ගී", "අපේ අවුරුද්දට අපේ ගායනා" සංගත තැටියත්, ඒ අනුව ඉදිරිපත් කෙරෙන ප්‍රසංගත් තරුණ ගී නිර්මාණකරුවන් රැසකගේ හපන්කම් එළි දැක්වීමට තැනුන වේදිකාවන් වීය. මේ අතරින් "ගම අවුලකද්කදං" ප්‍රසංගය වාර හයසීයය ද ඉක්මවා වේදිකාගත වෙමින් ඉදිරියෙන් සිටියි. රන්වල බලකාය ලොව හොඳම ජන ගී ප්‍රසාංගික කණ්ඩායම ලෙසින් රටවල් 66ක් අතරින් සම්මානයට පාත්‍රවීම අපගේ ජන ගීයේ මහිමය කියාපාන උපරිම තලයේ මං සළකුණක් ලෙස සටහන් වෙයි. ඩබ්.බී.මකුලොලුව ධීමතානන්ගේ පුරෝගාමිත්වයෙන් පෙළ ගැන්වුණ සැවොමගේ සිහිනයක් මල්ඵල ගැන්වීමක් ඒ. පන් තිත තිව්වා.මුණ හෝද ගන්න වෙලාව හරි.